8786

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | |
|---|---|
| **චිත්‍ර කලාව** | **I** |
| சித்திரக்கலை | I |
| Art | I |

**51 S I**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** | - | **මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ..................................

| **පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණයි.** | |
|---|---|
| **I පත්‍රය සඳහා** | |
| **කොටස** | **ලකුණු** |
| I | |
| II | |
| **එකතුව** | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |
| | |

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**
- අනුකොටස් **තුනකින්** සමන්විත ය. '**අ**' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා '**ආ**' සහ '**ඉ**' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

※ **I** කොටසට හා **II** කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

## I කොටස

● ප්‍රශ්න අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** තෝරන්න.

**1.** 43 වන කණ්ඩායමේ වැදගත්ම දායකත්වය වන්නේ,
(1) යුරෝපීය බහු ශෛලීය කලා ලක්ෂණ පිළිබඳ විශ්වාසය ලාංකේය කලාව තුළ ස්ථාපිත කිරීමයි.
(2) දේශීය හා විදේශීය කලා ලක්ෂණ ගුරුකොට ගත් කලා ව්‍යාපාරයක් ගොඩනැගීමයි.
(3) ශ්‍රී ලංකාවේ ප්‍රථම නූතනවාදී කලා ව්‍යාපාරය ගොඩනැංවීමයි.
(4) උපස්ථිතිවාදී ශිල්පක්‍රම ගුරුකොට ගත් කලා සංවිධානයක් බිහි කිරීමයි.
(5) දේශීය කලා සම්ප්‍රදායන්ට ප්‍රමුඛතාවය දෙමින් කලා ව්‍යාපාරයක් බිහි කිරීමයි. (.........)

**2.** බෙල්ලන්විල විහාරයේ සෝමබන්දු විද්‍යාපති ශිල්පියාගේ සිතුවම් හි කැපී පෙනෙන ලක්ෂණය වන්නේ,
(1) නාට්‍යමය බව හා අලංකාර රංග වස්ත්‍රාභරණ යොදා ගැනීමයි.
(2) බෞද්ධ කලාවේ ප්‍රකට තේමා නව මානයකින් ඉදිරිපත් කිරීමයි.
(3) රේඛාව හා වර්ණ කේන්ද්‍රීයව රූප ගොඩනැගීමයි.
(4) පුළුල් විචිත්‍රවත් වර්ණමාලාවක් භාවිත කිරීමයි.
(5) ලාලිත්‍යමය ස්වරූපයෙන් ප්‍රකාශනාංග ඉදිරිපත් කිරීමයි. (.........)

**3.** ඉන්දීය නව ජීවන ව්‍යාපාරයේ කාර්යභාරය වූයේ,
(1) යුරෝපීය යථාර්ථවාදී රීතීන් අනුගමනය කිරීමයි.
(2) ඉන්දීය හා පෙරදිග සාම්ප්‍රදායික කලා රීතීන් අනුගමනය කිරීමයි.
(3) මෝගල් චිත්‍රවල දක්නට ඇති සැරසිලි ක්‍රම අනුකරණය කිරීමයි.
(4) නූතන ඉන්දීය කලාවට පදනම සැපයීමයි.
(5) සාම්ප්‍රදායික දේශීය කලා රීතීන් පමණක් ගුරුකොට ගැනීමයි. (.........)

[දෙවැනි පිටුව බලන්න.


**4.** පුනර්ජීවන යුගයේ චිත්‍රකලා නිර්මාණ තුළින් ප්‍රකාශ වූයේ කුමක් ද?
(1) මිනිස් සිරුරේ කායික ව්‍යුහය නිවැරදිව ප්‍රතිනිර්මාණය කර දක්වන ආකාරයයි.
(2) ආගමික චිත්‍ර කලාවක් බිහි කිරීමට ගත් උත්සාහයයි.
(3) ආලේඛ්‍ය චිත්‍ර කලාව කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වීමයි.
(4) ස්වභාවිකවාදයට හා සිද්ධාන්ත භාවිතයට ප්‍රමුඛත්වය දීමයි.
(5) බාහිර සුන්දරත්වය හා භාව ප්‍රකාශනයට සුළු නැඹුරුවක් දැක්වීමයි. (.........)


**5.** ප්‍රාග් ඓතිහාසික යුගයේ සිතුවම් අතර කුඩා දරුවකුගේ මුද්‍රිත පා සලකුණු දක්නට ලැබෙන ගුහාව කුමක් ද?
(1) ලැස්කෝ (2) ඇල්ටමීරා (3) චෝවේ /ශෝවේ
(4) පොන්ඩිගෝම් (5) කෝගුල් (.........)

- ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැළපෙන වරණය 1** සිට **9** තෙක් අංක කර ඇති පහත සඳහන් පින්තූර ඇසුරෙන් තෝරන්න.


**1**



**2**


**3**


**4**


**5**


**6**


**7**


**8**


**9**

**6.** මෙම කලා නිර්මාණ අතුරින් ගුප්ත යුගයට අයත් නිර්මාණ කවරේ ද?
(1) **1,4** (2) **1,2** (3) **2,9** (4) **1,8** (5) **2,4** (.........)

**7.** මේ අතුරින් දක්නට ලැබෙන පල්ලව කලා නිර්මාණ මොනවා ද?
(1) **5,3** (2) **5,6** (3) **5,7** (4) **7,8** (5) **2,9** (.........)

**8.** මේ අතුරින් අමරාවතී කලා ලක්ෂණ දැක්වෙන නිර්මාණ මොනවා ද?
(1) **4, 8** (2) **4, 6** (3) **8, 9** (4) **4, 1** (5) **4, 9** (.........)

**9.** මේ අතුරින් මථුරා සම්ප්‍රදායානුකූල නිර්මාණ කවරේ ද?
(1) **1,4** (2) **1,8** (3) **4,9** (4) **1,9** (5) **6,9** (.........)


**10.** මේ අතර දක්නට ලැබෙන චෝළ සම්ප්‍රදායානුකූල නිර්මාණ මොනවා ද?
(1) **3, 7** (2) **6, 7** (3) **3, 5** (4) **3, 8** (5) **3, 6** (.........)

- ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය A, B, C, D, E** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


A


B


C


D


E

**11.** **A** අක්ෂරයෙන් නිරූපිත සිතුවම,
(1) කැන්වසය මත පින්තාරු කළ අලංකාර ගෙල මාලයකින් සැරසුණු ප්‍රභූ කාන්තාවකි.
(2) දැව ඵලකයක් මත කළ තරුණ කාන්තාවකගේ ආලේඛ්‍ය සිතුවමකි.
(3) ප්‍රභූ පාන්තික කතක් දැක්වෙන තෙල්සායම් සිතුවමකි.
(4) විමසුම් ස්වභාවය නිරූපිත ප්‍රභූ කාන්තාවකගේ ටෙම්පරා සිතුවමකි.
(5) ස්වභාවිකවාදී ලක්ෂණ ඉස්මතු කළ කාන්තාවකගේ ප්‍රෙස්කෝ සිතුවමකි. (.........)

**12.** **B** අක්ෂරයෙන් දැක්වෙන 'අසෝක දේවිය හා බෝධිය' නිරූපිත චිත්‍රය නිර්මාණය කළේ,
(1) අබනීන්ද්‍රනාත් තාගෝර් ය.
(2) ජෙමිනි රෝයි ය.
(3) නාරායන ස්වාමි ය.
(4) නන්දලාල් බොස් ය.
(5) අම්රිතා ෂර්ගිල් ය. (.........)

**13.** **C** අක්ෂරයෙන් දැක්වෙන 'රන්මාලුවා සමග සිටින ගැහැණු ළමයා' චිත්‍රය,
(1) ශාස්ත්‍රාලීය සම්ප්‍රදායන් අනුගමනය කරමින් තෙල් සායම් මාධ්‍යයෙන් නිමවූවකි.
(2) ස්වභාවිකවාදී සම්ප්‍රදාය අනුගමනය කරමින් තෙල් සායම් මාධ්‍යයෙන් නිමවූවකි.
(3) වස්තූන්ගේ ප්‍රකෘති බව කලාකරුවාගේ අභිමතය පරිදි වෙනස් කිරීමකි.
(4) භාවාත්මක චිත්‍ර ශෛලීය අනුගමනය කරමින් සංගත වර්ණ යොදා ගත් අවස්ථාවකි.
(5) මිනිස් හා සත්ත්ව හැඩතල ව්‍යුක්ත රූපීව නිර්මාණය කළ ප්‍රකාශනයකි. (.........)


**14.** **D** අක්ෂරයෙන් දැක්වෙන 'මව සහ දරුවා' චිත්‍රය,
(1) ඉන්දීය ජනකලා සම්ප්‍රදාය අනුව ශෛලීගත ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමකි.
(2) සරල කරන ලද මානව හැඩතල අර්ථවත්ව යොදා ගැනීමකි.
(3) දේශීය කලා ලක්ෂණ නිරූපිත භාවාත්මක නිර්මාණයකි.
(4) ද්විමාන හැඩතල හා වර්ණ භාවිතයෙන් කළ ප්‍රකාශනයකි.
(5) දරු සෙනෙහස සරල හැඩතල මගින් ප්‍රකාශ කිරීමකි. (.........)

**15.** **E** අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය,
(1) ග්‍රීක මැටි බඳුන් අතර ජනප්‍රිය හැඩයකින් යුතු වූවකි.
(2) ග්‍රීක මිත්‍යා කථා ඇසුරෙන් අලංකාර කළ බඳුනකි.
(3) රක්තරූපී සම්ප්‍රදාය අනුව කළ බඳුනකි.
(4) ඇම්පෝරා වර්ගයට අයත් බඳුනකි.
(5) කාලරූපී සම්ප්‍රදාය අනුව කළ බඳුනකි. (.........)

● ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන වරණය** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.



F




G



H



I



J

**16.** **F** අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ඇතුන්ගේ කෙළිලොල් අවස්ථා නිරූපිත අර්ධ උන්නත කැටයමකි.
(2) ඉසුරුමුණියේ පොකුණට ඉහළින් ගල්පර්වතයේ නෙළා ඇති කැටයමකි.
(3) රන්මසු උයනේ පොකුණක් ආශ්‍රිතව නෙළා ඇති කැටයමකි.
(4) ශෛලීගත ස්වරූපයෙන් නෙළන ලද ඇත් රුවකි.
(5) ඇතෙකු ජලයේ බැස දිය නාන ඉරියව් දැක්වෙන කැටයමකි. (………)


**17.** **G** අක්ෂරයෙන් දක්නට ලැබෙන ජෙරුසලම වටලෑම නම් වූ රෝම කැටයම
(1) කොන්ස්ටන්ටයින් ආරුක්කුවේ ඉහළ මුහුණතෙහි දක්නට ලැබේ.
(2) ට්‍රජන් කුලුණෙහි බඳෙහි දක්නට ලැබේ.
(3) කොන්ස්ටන්ටයින් ආරුක්කුවේ පහළ මුහුණතෙහි දක්නට ලැබේ.
(4) ට්‍රජන් කුලුණෙහි ඉහළ කොටසේ දක්නට ලැබේ.
(5) ටයිටස් ආරුක්කුවේ ඇතුළත කොටසෙහි දක්නට ලැබේ. (………)

**18.** **H** අක්ෂරයෙන් දැක්වෙන පුවරු කැටයම
(1) භාරුත් චෛත්‍ය බිත්තියේ යොදා තිබූ කැටයමකි.
(2) භාරුත් ගල් කණු මත සවිකර තිබූවකි.
(3) භාරුත් ගල්වැටේ කණු මත නෙළන ලද කැටයමකි.
(4) භාරුත් චෛත්‍ය නටඹුන් අතරින් හමුවූවකි.
(5) භාරුත් ගල්වැටේ ප්‍රාකාර ශීර්ෂ ශිලාවේ කැටයමකි. (………)

**19.** **I** අක්ෂරයෙන් දැක්වෙන ඉන්දුනිම්න මුද්‍රාවෙන් නිරූපණය වන්නේ,
(1) වනයට අධිපති රුක් දෙවියෙකි.
(2) වන සතුන්ට අධිපති දෙවියෙකි.
(3) වන සතුන් හීලෑ කරන මිනිසෙකි.
(4) ව්‍යාඝ්‍රයන් සමග සටන් වදින මිනිසෙකි.
(5) ව්‍යාඝ්‍රයන් සමග සිටින දෙවියෙකි. (………)

**20.** **J** අක්ෂරයෙන් දැක්වෙන ශිලාමය ඵලකයෙන් ප්‍රකාශ වන්නේ,
(1) නාමර් රජුගේ යුධ දර්ශනයන් ය.
(2) පාරාවරුන්ගේ යුධ සටන් දර්ශනයන් ය.
(3) හෝරස් දෙවියන් සමග කෙරෙන සටන් දර්ශනයන් ය.
(4) කාෆ්රේ රජුගේ ජීවන තොරතුරු ය.
(5) මෙන්කුරේ රජු සතුරන් සමග යුධවදින අයුරු ය. (………)


● ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රකාශයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.


K


L


M


N


O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය හමුවන්නේ,
(1) මැදිරිගිරිය වටදාගෙය තුළිනි.
(2) අම්බස්තල දාගැබ අසළිනි.
(3) පොළොන්නරු වටදාගෙය තුළිනි.
(4) තිරියාය වටදාගෙය තුළිනි.
(5) ථූපාරාම චෛත්‍ය අසළිනි. (.........)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙන යුගල මූර්තියෙන් නිරූපණය වන්නේ,
(1) අක්නේටන් රජු හා නෙපර්ටිටි බිසවයි.
(2) නාමර් රජු හා බිසවයි.
(3) මෙන්කුරේ රජු සහ බිසවයි.
(4) රමෙසස් රජු හා බිසවයි.
(5) කාෆ්රේ රජු හා බිසවයි. (.........)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙන පියෙටා මූර්තියෙන් ප්‍රකාශ වන්නේ,
(1) මරිය මව් තුරුලේ හොවාගෙන සිටින ජේසුතුමන්ගේ සිරුර ය.
(2) මවගේ දරු සෙනෙහසත් ජේසුතුමන්ගේ සිරුරේ අප්‍රාණික බවත් ය.
(3) ජේසුතුමන්ගේ වියෝව නිසා වැළපෙන මරියතුමියන් ය.
(4) මව හා වියෝ වූ දරුවා පිළිබඳ අනුවේදනීය පුවතකි.
(5) කිරිගරුඬ මාධ්‍යයෙන් කළ දරු සෙනෙහස ප්‍රකාශිත මූර්තියකි. (.........)

**24.** **N** අක්ෂරයෙන් දැක්වෙන නටරාජ මූර්තියේ විශේෂත්වය වන්නේ,
(1) බැතිමතුන් මායාවෙන් මුදවා ගැනීමයි.
(2) ශාරීරික ඉරියව් ඇසුරෙන් ආගමික සංකල්ප රැසක් ප්‍රකාශ කිරීමයි.
(3) අවකාශ භාවිතය හා චලනමය ඉරියව් අර්ථාන්විතව යොදා ගැනීමයි.
(4) විශ්වය පිළිබඳව සංකේතාත්මකව අර්ථ නිරූපණය කිරීමයි.
(5) තාණ්ඩව නර්තන විලාසය තුළින් භාවාර්ථ ප්‍රකාශ කිරීමයි. (.........)

**25.** **O** අක්ෂරයෙන් දැක්වෙන ගව රූවක් සහිත ස්ථම්භ ශීර්ෂය
(1) අශෝක රජු විසින් කළ ප්‍රථම ස්ථම්භයේ ශීර්ෂයයි.
(2) රාම්පූර්වා ස්ථම්භයේ ශීර්ෂයයි.
(3) බුදුන් පිරිනිවන් පෑ ස්ථානයේ කළ ස්ථම්භයේ ශීර්ෂයයි.
(4) ලෞරියා නන්දගර් ස්ථම්භයේ ශීර්ෂයයි.
(5) වප්මගුල සිහිපත් කෙරෙන ස්ථම්භයේ ශීර්ෂයයි. (.........)

● ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** තෝරන්න.

**26.** අර්ථපූර්ණ දෘශ්‍යකලා සංරචනයක් ලෙස ගැනෙනුයේ,
(1) මනෝමය සංකල්පනාවක් පිළිබඳව දෘශ්‍යමය ප්‍රකාශනයකි.
(2) වර්ණ, රේඛා, හැඩතල මගින් කෙරෙන අර්ථපූර්ණ ප්‍රකාශනයකි.
(3) අත්දැකීමක් පදනම් කර ගනිමින් තලයක් මත සිදු කරන ප්‍රකාශනයකි.
(4) පැහැපත් වර්ණ මාලාවකින් සිදුකරන අර්ථවත් ප්‍රකාශනයකි.
(5) කිසියම් තේමාවක් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීමකි. (.........)

**27.** ඊජිප්තු වාස්තු විද්‍යා නිර්මාණයන්ට පාදක වූ පසුබිම වූයේ,
(1) ලොව විශාලතම වාස්තුවිද්‍යා නිර්මාණ බිහිකිරීමයි.
(2) පාරාවරුන්ගේ බල පරාක්‍රමය පෙන්වීමයි.
(3) මරණින් මතු ආත්මය හා බැඳි ඇදහීම් පද්ධතියයි.
(4) ලෞකික රාජකීය ගොඩනැගිලි සඳහා ලෝකෝත්තර බවක් ලබා දීමයි.
(5) මෘතශරීර (මමී) තැන්පත් කිරීම සඳහා සොහොන් ගෙවල් තැනීමයි. (.........)

**28.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ හමුවන කලා නිර්මාණ තුළින් නිරූපණය වන්නේ,
(1) ස්වභාවික මානව දේහය නිර්මාණය කිරීමේ නිපුණතාවයි.
(2) මානව රුව තුළින් විවිධ සංකල්පනා නිරූපණය කිරීමයි.
(3) විවිධ මාධ්‍ය හා ශිල්ප ක්‍රම ඇසුරෙන් නිර්මාණ බිහිකිරීමයි.
(4) ඇදහිලි හා විශ්වාස පදනම් කරගෙන කලා නිර්මාණ බිහිකිරීමයි.
(5) ජන ජීවිතය හා සොබාදහම අතර සබඳතාවය ප්‍රකාශ කිරීමයි. (.........)

**29.** හෙලනිස්ටික් යුගයේ දී ග්‍රීක මූර්ති කලාවේ ඇති වූ විශේෂත්වය වූයේ,
(1) පරමාදර්ශීවාදයට වඩා භාව ප්‍රකාශිත ස්වභාවය ඉස්මතුවීමයි.
(2) තාරුණ්‍ය හා පිරිපුන් දේහ ලක්ෂණ දැක්වීමයි.
(3) අස්ථි හා මාංශපේශි ක්‍රියාකාරීත්වය වෙනස්වන අයුරු දැක්වීමයි.
(4) මිසර කලාවේ ආභාසය මත මූර්ති නිර්මාණය වීමයි.
(5) ස්ත්‍රී රුවේ සුන්දරත්වය හා පිරිමි සිරුරේ ශක්තිය දැක්වීමයි. (.........)

**30.** ශ්‍රී ලාංකේය ඓතිහාසික වාස්තු විද්‍යාත්මක කලා නිර්මාණ පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පැරණිතම හා කලාත්මකම වාහල්කඩ මිහින්තලේ ඛණ්ඩක චෛත්‍යයේ බටහිර වාහල්කඩයි.
(2) පූර්ණ උන්නතව නිර්මාණය කරන ලද විශාල පුන්කලස් අනුරාධපුර කුට්ටම් පොකුණේ දැකගත හැකි ය.
(3) සිංහරූප යෙදූ කොරවක්ගල් යුගලයක් අභයගිරිය විහාරයෙන් හමුවී ඇත.
(4) පොළොන්නරුව වටදාගේ සඳකඩ පහනේ සතුන් හතරදෙනා දක්ෂිණාවර්තව වෙන් වෙන් ව ගමන් කරයි.
(5) රත්න ප්‍රාසාදයේ මුරගල් අතර සංඛනිධි හා පද්මනිධි මුරගල් වඩාත් සුවිශේෂී වේ. (.........)


● ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

**31.** දැවයෙන් කරන ලද මෙම නිර්මාණය
(1) ඇම්බැක්කේ දේවාලය අනුව කළ සමකාලීන නිර්මාණයකි.
(2) ගමන් බිමන් යන අයගේ විවේකය සඳහා ඉදිකළ මණ්ඩපයකි.
(3) ගම්පොල ප්‍රදේශයේ වෙල්යායක් මැද ඉදිකළ ගොඩනැගිල්ලකි.
(4) අලංකාර කැටයමෙන් යුතු දෙවියන් උදෙසා කළ ගෘහ නිර්මාණයකි.
(5) ටැම්පිටව ඉදිකරන ලද ඓතිහාසික ගොඩනැගිල්ලකි.




(.........)

**32.** මෙහි දැක්වෙන පෞරාණික ගොඩනැගිල්ල
(1) ඇතන්ස් හි සියුස් දේවස්ථානයයි.
(2) සමොස්හි හේරා දෙවඟනගේ දෙවොලයි.
(3) ඉරෙක්තියන් ගොඩනැගිල්ලකි.
(4) ග්‍රීක ඔලිම්පියා මණ්ඩපයකි.
(5) ග්‍රීක පාතිනොන් දේවස්ථානයයි.



(.........)


**33.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යාත්මක නිර්මාණය



(1) ඩොමිතියන් අධිරාජ්‍යයාගේ බලය පෙන්වීමට කරන ලද්දකි.
(2) ට්‍රැජන් අධිරාජ්‍යයා සිහිවීම පිණිස කළ ආරුක්කුවකි.
(3) රෝමයේ කොන්ස්ටන්ටයින් ආරුක්කුවයි.
(4) ඩේසියන් අධිරාජ්‍යයා විසින් ඉදිකළ ආරුක්කුවයි.
(5) රෝමයේ ඉදි වූ ටයිටස් ආරුක්කුවයි.

(.........)


**34.** මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය



(1) භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා උදෙසා කළ පධානඝරයකි.
(2) එකිනෙකට සම්බන්ධවනසේ තැනූ විවෘත මණ්ඩප දෙකකින් යුතු ආරාමයකි.
(3) ආරණ්‍යගත භික්ෂූන් වහන්සේලා උදෙසා ඉදිකළ උපෝසතඝරයකි.
(4) භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් තැනූ ආවාස කුටි සහිත ජන්තාඝරයකි.
(5) පශ්චිමාරාමවාසී භික්ෂූන් උදෙසා කළ භාවනා කුටි සමූහයකි.

(.........)


**35.** මෙහි දැක්වෙන්නේ,



(1) ඉසුරුමුණි විහාර භූමියේ පිහිටි ඉන්දීය පල්ලව කලා ලක්ෂණ සහිත පොකුණකි.
(2) අභයගිරි විහාර භූමියේ පිහිටි ආයත චතුරස්‍රාකාර හැඩයෙන් යුතු ශිලාමය පොකුණයි.
(3) මහා පරාක්‍රමබාහු රජුගේ මගුල් උයනේ පිහිටි සුවිශේෂී පොකුණයි.
(4) ඉසුරුමුණි රන්මසු උයනේ ඇති රාජකීයන්ගේ ස්නානය වෙනුවෙන් කළ මගුල් පොකුණයි.
(5) මහා පරාක්‍රමබාහු රජ සමයේ ජේතවන විහාරයේ වැඩ විසූ භික්ෂූන් වහන්සේලා උදෙසා තැනූ පොකුණකි.

(.........)

- ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** පිකාසෝ ශිල්පියාගේ මෙම නිර්මාණය
(1) සෙසාන්ගේ ආකෘතිමය න්‍යාය අනුව කරන ලද්දකි.
(2) ෆෝවිසම් කලා ලක්ෂණ අනුගමනය කරමින් කරන ලද්දකි.
(3) ඝණිකවාදී හැඩතල ඇසුරෙන් කළ ප්‍රකාශනයකි.
(4) රෝස යුගයේ අවසාන භාගයේ දී කළ ප්‍රකාශනයකි.
(5) අප්‍රිකානු කලා ලක්ෂණ අනුව කළ ප්‍රකාශනයකි. (.........)

**37.** මෙම සිතුවමේ තේමාව වන්නේ,
(1) වීදි අභිසාරිකාවන් පිරිසකගේ පැතිකඩ පිළිබඳ ප්‍රකාශනයයි.
(2) බාහිර සුන්දරත්වයට වඩා අභ්‍යන්තර බේදාන්තය පිළිබඳව අවධාරණය කිරීමයි.
(3) වීදි අභිසාරිකාවන්ගේ ජීවිතයේ අසුන්දරත්වය පිළිබඳ ගැඹුරු ප්‍රකාශනයයි.
(4) වීදි කාන්තාවන්ගේ ජීවිතයේ අභ්‍යන්තරය පිළිබඳ විග්‍රහ කිරීමයි.
(5) වීදි කාන්තාවන්ගේ මානසික ප්‍රතිවිරෝධතාවයන් පිළිබඳ ප්‍රකාශනයයි. (.........)

**38.** මෙහි සංරචන ස්වරූපය වන්නේ,
(1) නග්න කාන්තා රූ සමූහයක් ඛණ්ඩනය වූ පසුතලයක් මත ගොනු කිරීමයි.
(2) එකින් එකට විවිධ වූ කාන්තා රූ පහක් විවිධ ඉරියව් මත සම්පිණ්ඩනය කිරීමයි.
(3) කාන්තා රූ ජ්‍යාමිතික ආකෘතියක් මත ගොනු කිරීමයි.
(4) විවිධ මානව ඉරියව් සිතුවම තුළ ප්‍රකාශනාත්මකව පෙළ ගැස්වීමයි.
(5) කාන්තා රූප සමූහයේ ආකෘතිය ව්‍යුක්ත රූපීව තලය මත නිරූපණය කිරීමයි. (.........)

**39.** සිතුවමේ චිත්‍රමය භාෂාව තුළින් බලාපොරොත්තු වූයේ,
(1) ස්වභාවිකත්වය අනුකරණය කිරීම නම් වූ කලා විශ්වාසය බැහැර කිරීමයි.
(2) හැඩයේ ස්වභාවය අපහැදිලි වීම තුළ නොබිඳෙන සුළු අවකාශයක් ඇති කිරීමයි.
(3) චිත්‍රයේ අනන්‍යතා හැඩ සහිත රූප වෙනස් හැඩතල බවට පත්කර අදහසක් පැවසීමයි.
(4) ඝණිකවාදයේ සංවර්ධනාත්මක අවධියක් නිරූපණයට ගත් උත්සාහයයි.
(5) විෂයානුබද්ධව නිරූපිත ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝක ලක්ෂණ නොදැක්වීමයි. (.........)

**40.** හැඟීම් ප්‍රකාශනයේ දී,
(1) ඝණිකවාදී හැඩතල සහිත කාන්තා රූ තුළින් ප්‍රකාශිත තේමාව තීව්‍ර කිරීමට හැකිවීම අගය කළ හැකිය.
(2) ශිල්පියා තුළ ඇති භාවාත්මක ප්‍රකාශන හැකියාව වර්ණ හා හැඩතල මගින් පිළිඹිබු වීම ප්‍රශස්තය.
(3) ෆෝවිසම් කලා ලක්ෂණ වීදි කාන්තාවන්ගේ චරිත හරහා ප්‍රකාශ කිරීමට ගත් උත්සාහය ප්‍රශංසනීයය.
(4) ස්ත්‍රීන්ගේ මානසික ප්‍රතිවිරෝධතා භාවාත්මකව දැක්වීමට අප්‍රිකානු වෙස් මුහුණුවල ස්වභාවයන් යොදා ගැනීම ප්‍රශංසනීය ය.
(5) සෙසාන්ගේ ආකෘතිමය අත්හදාබැලීම් ප්‍රායෝගික ව භාවිත කර ඇති අයුරු අගය කළ හැකිය. (.........)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* 'අ' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

### 'අ' කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** සම්භාව්‍ය කලා සම්ප්‍රදාය ගුරු කොට ගත් අනුරාධපුර හා පොළොන්නරු යුගයන් හි චිත්‍ර ශෛලිය මහනුවර රාජධානි සමයේ දී වෙනස් මගකට යොමු විය.

(i) අනුරාධපුර යුගයේ සම්භාව්‍ය චිත්‍ර කලාව දක්නට ලැබෙන ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි දක්නට ලැබෙන චිත්‍ර අතර 'බුදුරජාණන් වහන්සේ සංකස්ස නුවරට වැඩම කිරීම' සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) මහනුවර චිත්‍ර සම්ප්‍රදාය තුළ දෙගල්දොරුව විහාරයේ හා දඹුල්ල විහාරයේ දක්නට ලැබෙන 'මාර පරාජය' සිතුවම් දෙක පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි.)

**2.** ගම්පොළ රාජධානි සමය චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ රැසක් දැයට දායාද කළ සමයකි.

(i) ගම්පොළ යුගයේ හමුවන වාස්තු විද්‍යා ශිල්පීන් **දෙදෙනකු** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ගඩලාදෙණි විහාරයේ දක්නට ලැබෙන 'විජයොත්පාය' නම් වූ අගනා වාස්තු විද්‍යා නිර්මාණය පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි.)

(iii) දැව කැටයම් ඇසුරෙන් අලංකාර වූ ඇම්බැක්කේ දේවාලය ගම්පොළ යුගයේ හමුවන විශිෂ්ටතම කලාගාරයකි. එහි දක්නට ලැබෙන කැටයම් පිළිබඳව වර්ගීකරණය, මාධ්‍ය භාවිතය, ශිල්පක්‍රම හා ශිල්පීය කුසලතා ඇතුළත් විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි.)

**3.** හින්දු ආගමික සංකල්ප මත පදනම්ව නිර්මාණකරණයේ යෙදීම පොළොන්නරු යුගයේ වූ විශේෂිත ලක්ෂණයක් විය.

(i) පොළොන්නරු යුගයේ නිම වූ ලෝකඩ මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) අංක 1 ශිව දේවාලයේ ගෘහ නිර්මාණ ලක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) පොළොන්නරු යුගයේ ඉදි වූ 'ථූපාරාම පිළිමගෙය' හින්දු ආගමික ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව නිම වූ බෞද්ධ සිද්ධස්ථානයකි. එහි ආභාසය, සැලැස්ම, මාධ්‍ය භාවිතය හා බාහිර ලක්ෂණ ඇතුළත්වන පරිදි විමසීමක් කරන්න. (ලකුණු 08 යි.)

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** විවිධ යුගයන් හි පැවති ඉන්දීය සිතුවම් කලාව එකිනෙකට සුවිශේෂී වූ ලක්ෂණ සහිතව වර්ධනය වූවකි.

(i) අජන්තා සිතුවම් පාදක කොට ගෙන ක්‍රි.ව. 450 ට පෙර හා පසු ඉදි වූ ලෙන් වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ලෞකික තේමා ගුරු කොටගත් මෝගල් සිතුවම් සම්ප්‍රදායේ එන 'බාබුර් අධිරාජ්‍යයාගේ උද්‍යාන නිරීක්ෂණය' සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඉන්දීය කලා සම්ප්‍රදායයන් තුළ කාන්තා රුව නිර්මාණයේ දී ඊට සුවිශේෂී වූ විවිධතා දක්නට ලැබේ. අජන්තා සිතුවම් හි 'අප්සරා රුව' හා රාජ්පුට් සිතුවම් කලාවේ දක්නට ලැබෙන 'රාධා' සිතුවම පිළිබඳ සංසන්දනාත්මකව ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි.)

**5.** ක්‍රි.පූ. 25 සිට ක්‍රි.ව. 320 තෙක් අමරාවතිය කේන්ද්‍ර කොට ගෙන බිහි වූ කලාව 'අමරාවති කලාව' නම් වේ.

(i) අමරාවතියෙන් හමුවන වෘත්තාකාර පුවරු කැටයම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ඉන්දීය අමරාවතී කැටයම් අතර එන 'මහාමායා සිහිනය' කැටයම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඉන්දීය අමරාවතී සම්ප්‍රදායේ කැටයම් අතර හමුවන බුදු සිරිතේ සිද්ධීන් ඇතුළත් ස්ථම්භ කැටයමෙහි අන්තර්ගතය හා ශිල්පීය කුසලතා පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි.)

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**6.** උපස්තිථිවාදයෙන් පසු බිහි වූ නව ප්‍රවණතාව වූයේ පශ්චාත් උපස්තිථිවාදයයි.

(i) පශ්චාත් උපස්තිථිවාදය බිහිවීමට තුඩුදුන් හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) 'අප එන්නේ කොහි සිට ද?, අප කවුරු ද?, අප යන්නේ කොහාට ද?' (Where do we come from?, Who are we?, Where are we going?) යන පෝල් ගොගැන්ගේ (Paul Gauguin) සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) වින්සන්ට් වැන්ගෝ (Vincent Van Gogh) ශිල්පියාගේ 'අර්තාපල් බුදින්නෝ' (The Potato Eaters) සහ 'තරු පිරි රැය' (The Starry Night) එකිනෙකට වෙනස් වූ සිතුවම් දෙකකි. සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි.)

**7.** ඊජිප්තුවේ හමු වූ කලා අංග යුගයෙන් යුගයට වෙනස්වීම්වලට භාජනය වෙමින් වර්ධනය විය.

(i) පිරමීඩය ඊජිප්තුවේ විශේෂ වාස්තු විද්‍යා නිර්මාණයකි. එය වර්ධනය වූ අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(ii) නව රාජධානි යුගයට අයත් චිත්‍රකලා නිර්මාණයක් වූ 'නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ' (Musicians and Dancers) සිතුවම පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඊජිප්තුවේ දක්නට ලැබෙන ප්‍රධාන දේවස්ථාන වන ලක්සෝර් (Luxor) හා අබුසිම්බල් (Abu Simbel) දේවස්ථාන පිළිබඳ පදනම් වූ සංස්කෘතික පසුබිම, මාධ්‍ය භාවිතය, ආකෘතිය හා බාහිර ලක්ෂණ ඇතුළත් සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි.)

* * *

AL/2024/51/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

චිත්‍ර කලාව II
சித்திரக்கலை II
Art II

**51 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් අධ්‍යයනය කිරීම සඳහා යොදාගන්න.**

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය**, ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
- ඔබ වෙත සපයා ඇති විශේෂ **ඇඳීමේ කඩදාසිය** (Drawing paper) වර්ණ චිත්‍රය ඇඳීම සඳහා භාවිත කරන්න. වෙනත් කිසිම චිත්‍රයක් හෝ අධ්‍යයන සටහනක් ඇඳීම අවශ්‍ය නොවේ.
- ඔබගේ චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසිදායක විය හැකි ය.

## ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

පහත සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

* කඩදාසියේ තලය, අර්ථවත් ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.

* ද්‍රව්‍යයන්ගේ ගතිලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ ව සැලකිලිමත් වන්න.

* ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.

* වර්ණ මාධ්‍යය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත් ව භාවිත කරන්න.

* ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි වර්ණවත් පසුබිමක් යොදන්න.

* ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකයේ (ලෑල්ලේ) පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට හැකි ය.

* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.

***

AL/2024/51/S-III

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | |
|---|---|
| **චිත්‍ර කලාව** | **III** |
| **சித்திரம்** | **III** |
| **Art** | **III** |

**51 S III**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** | - | **මිනිත්තු 10 යි** |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මෙම මාධ්‍යයන් කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.
* අවශ්‍ය අයට ඊෂු කඩදාසි සපයනු ලැබේ.
* චිත්‍රය භාර දෙන විට, එය සම්පූර්ණයෙන් ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකි ය.

● පහත සඳහන් **'අ'**, **'ආ'** සහ **'ඉ'** යන කොටස් තුන අතුරෙන් **එක්** මාතෘකාවක් පමණක් තෝරාගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. ගල්තලා සහිත නොගැඹුරු ගංගාවක දිය නාන අලි, නරඹන සංචාරකයෝ
2. පාසලේ විවිධ ප්‍රසංගයක් සඳහා පෙර සූදානම් වන සිසු සිසුවියන් පිරිසක්
3. ශිල්ප කලා වැඩපලක් තුළ සාම්ප්‍රදායික වෙස්මුහුණු කලාවේ නියැලෙන ශිල්පීන් පිරිසක්
4. පාරිභෝගිකයන්ගෙන් පිරි සුපිරි වෙළෙඳසලක් ඇතුළත

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. ස්වර්ණාභරණ බහාලීම සඳහා තඹ හා රිදී තහඩු භාවිතයෙන් නිම කර වර්ණවත් මැණික් එබ්බවූ මංජුසාවක් සැලසුම් කර සාම්ප්‍රදායික මෝස්තර ඇසුරෙන් සැරසිලි කර වර්ණ කරන්න.
6. විදේශීය සංචාරකයන් ගැවසෙන තරු පන්තියේ හෝටලයක ආලින්දයේ බිත්තියකට උචිත අඩි $6' \times 8'$ ප්‍රමාණයේ බිත්ති සැරසිල්ලක් කල්පිත සත්ත්ව රූපයක් ඇසුරෙන් සැලසුම් කර බතික් ක්‍රමයට වර්ණ ගැන්වීමට සුදුසු පරිදි වර්ණ කරන්න. (ප්‍රමාණය පරිමාණානුකූලව සකසා ගන්න.)
7. මධ්‍ය කේන්ද්‍රයේ සිට විසිර යන ආකෘතියක් මත ජ්‍යාමිතික හැඩ භාවිත කොට, ඇඳ ඇතිරිල්ලකට සුදුසු වර්ණවත් අඩි $7' \times 8'$ ප්‍රමාණයේ මුලුතල මෝස්තරයක් නිර්මාණය කරන්න. (ප්‍රමාණය පරිමාණානුකූලව සකසා ගන්න.)

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

8. ශ්‍රී ලංකාවේ සොබා දහම පිළිබඳව ලියවුනු 'සොබා අසිරිය' නමින් මුද්‍රණය කෙරෙන ග්‍රන්ථයකට සුදුසු පිට කවරයක් ඇඳ වර්ණ කරන්න. (මුල් පිටුව, සනකම හා පසු පිටුව ඇතුළත් විය යුතුය.)
9. ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට නියමිත නව රූපවාහිනී නාලිකාවකට උචිත ලාංඡනයක් නිර්මාණය කරන්න. (තලය උචිත පරිදි භාවිත කරන්න.)
10. ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කාන්තා දායකත්වය තේමා කරගත් වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

***

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 51 - චිත්‍ර කලාව

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

## 51 - චිත්‍ර කලාව

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

# 51 - චිත්‍ර කලාව - I, II, III

# ලකුණු දීමේ පටිපාටිය

චිත්‍ර කලාව I - මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. I වන කොටස බහුවරණ ප්‍රශ්න 40 කින් ද දෙවන කොටස ව්‍යුහගත ප්‍රශ්න 07 කින් ද යුක්ත වේ. බහුවරණ පත්‍රය අනිවාර්ය වන අතර දෙවන කොටසට අයත් "අ" කොටසින් ප්‍රශ්න දෙකක් හා ආ, ඉ, යන අනු කොටස් දෙකෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ප්‍රශ්න හතරක් තෝරාගත යුතු වේ. බහුවරණ ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් ලැබෙන අතර ව්‍යුහගත ප්‍රශ්න හතරට 15 බැගින් ලකුණු 60 ක් හිමි වේ. මේ අනුව ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් ලැබේ.

චිත්‍ර කලාව II - ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි. මෙහි ඇතුළත් වනුයේ එක් ප්‍රායෝගික ක්‍රියාකාරකමක් සඳහා වූ එක් ප්‍රශ්නයකි. "නිදහස් රේඛාමය ඇඳීම හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය" යනුවෙන් මෙය හැඳින්වේ. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

චිත්‍ර කලාව III - ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි. මෙය "අ" "ආ" "ඉ" යනුවෙන් කොටස් තුනකින් යුක්ත ය.

"අ" - චිත්‍ර සංරචනය
"ආ" - මෝස්තර නිර්මාණය
"ඉ" - ගැෆ්‍රික් චිත්‍ර නිර්මාණය

ඉහත සඳහන් කොටස් තුනෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු වේ. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.

එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 100 බැගින් ප්‍රශ්න පත්‍ර තුනට ලකුණු 300 කි. එම පත්‍ර තුන වෙන වෙනම අගයා අදාළ ලකුණ එම පත්‍රවල යොදන්න. පත්‍ර තුනේ ලකුණු එකතු කිරීම අවශ්‍ය නොවේ.

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................
............................................................
............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................
............................................................
............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................
............................................................
............................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

# I පත්‍රය - චිත්‍ර කලාව

අභිමතාර්ථ :-

1. ශ්‍රී ලංකාව, ඉන්දියාව, යුරෝපය ආශ්‍රිත කලා නිර්මාණයන්ගේ සංස්කෘතික පසුබිම පිළිබඳ ශිෂ්‍යයා අත්පත් කරගෙන ඇති නිපුණතා පිරික්සීම.
2. විශ්ව ශිල්පීන් හා ඔවුන්ගේ කලා කෘති හඳුනාගෙන ඒවායේ පසුබිම, මාධ්‍ය භාවිතය, වස්තු විෂය, ශිල්ප ක්‍රම හා භාව ප්‍රකාශන පිළිබඳ ඇගයීමේ හා රසවිඳීමේ හැකියාව මැන බැලීම.
3. උගත් විෂය කරුණු නිරවුල්ව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීමේ හැකියාව මැන බැලීම.

පළමුවැනි ප්‍රශ්න පත්‍රයට ලකුණු දීමේදී කොටස් දෙක ගැන වෙන වෙන ම ලකුණු කිරීමට විශේෂයෙන් සැලකිලිමත් වන්න. පළමු වැනි කොටස වන බහුවරණ පත්‍රයට පිළිතුරු සපයා ඇත්තේ එම පත්‍රයේම බැවින් නිවැරදි හරි වැරදි ලකුණු කොට නිවැරදි පිළිතුරු ගණනය කොට හිමි ලකුණ පිළිතුරු පත්‍රයේ ඉහළ දකුණු කෙළවරේ අදාල කොටුව තුළ යොදන්න. දෙවන කොටසේ තෝරාගෙන ඇති ප්‍රශ්න හතර වෙන් වෙන්ව අගයා එකිනෙක කොටස් වලට හිමි ලකුණු නිවැරදිව අදාල පිළිතුර අවසානයේ ලියා එකතුකොට දක්වන අතර එම ප්‍රශ්න හතරේ එකතුව බහුවරණ පත්‍රයේ ඉදිරි පිටුවේ ඉහළ දකුණු කෙළවරේ අදාල කොටුව තුළ යොදා එකතු කරන්න.

අවසානයේ එකිනෙක පිළිතුරට හිමි ලකුණ අදාල ප්‍රශ්න අංක යටතේ මුල් පිටුවට ගෙන පිළිතුරු සියල්ලේ ම එකතුව නිවැරදිව ගණනය කොට 1 වැනි පත්‍රයට හිමි කොටුව තුළ යොදන්න.

ලකුණු කරන ලද සෑම උත්තර පත්‍රයක් ම වෙනත් අයෙකු විසින් පරීක්ෂා කළ යුතුවේ. මුල් පරීක්ෂකවරයාත් දෙවනුව පරීක්ෂා කරන පරීක්ෂකවරයාත් තම සංකේත අංකය අනිවාර්යයෙන්ම පිළිතුරු පතේ සටහන් කළ යුතු ය.

ලකුණු ලැයිස්තු පිළියෙල කිරීමේදී ද තම තමන් විසින්ම කළ යුතු ය. කියවන විට ලිවීම නොකළ යුතු වේ. එකිනෙක ප්‍රශ්නයට හිමි ලකුණ මුල් පිටුවට ගැනීමේදීත් එම ලකුණු, ලකුණු ලැයිස්තුවට ගැනීමේදීත් ඉතා නිවැරදිව කළ යුතුය. සෑම ඉලක්කමක්ම නිවැරදිව ලිවිය යුතු සේම ඉතා පැහැදිලිව තිබීම ද වැදගත්ය. ඉලක්කමක් වැරදුනහොත් එක ඉරකින් කපා නැවත ලියා අත්සන යොදන්න. මැකීම හෝ සීරීම හෝ මකන දියර භාවිතය නොකළ යුතු ය.

අපේක්ෂකයන් නියමිත ප්‍රමාණයට වඩා පිළිතුරු ලියා තිබෙන්නට පිළිවන. එවැනි අවස්ථාවල දී සියලුම පිළිතුරු ලකුණු කොට අඩු ලකුණු ලබාගත් වැඩිපුර ලියා ඇති පිළිතුරු කපා හරින්න. කොටස් තුනෙන් නියමිත ප්‍රමාණය නොසලකා ලියා ඇති අවස්ථාවලදී ද එම පිළිතුරු කපා හරින්න. කපා හරින ලද පිළිතුරු සම්බන්ධයෙන් පහතින් සටහනක් යොදන්න. පිළිතුරු පත් පළමු ලකුණු කිරීම සඳහා රතුපාට පෑනක් භාවිත කිරීම අනිවාර්ය වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

විෂය අංකය / பாட இலக்கம்: 51
විෂයය / பாடம்: චිත්‍ර කලාව

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 2 | 21. | 3 | 31. | 5 |
| 02. | 1 | 12. | 1 | 22. | 3 | 32. | 5 |
| 03. | 2 | 13. | 3 | 23. | 2 | 33. | 3 |
| 04. | 4 | 14. | 1 | 24. | 4 | 34. | 1 |
| 05. | 3 | 15. | 5 | 25. | 2 | 35. | 4 |
| 06. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 3 |
| 07. | 3 | 17. | 5 | 27. | 3 | 37. | 2 |
| 08. | 1 | 18. | 3 | 28. | 4 | 38. | 5 |
| 09. | 4 | 19. | 4 | 29. | 1 | 39. | 1 |
| 10. | 5 | 20. | 1 | 30. | 2 | 40. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

## 'අ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** සම්භාව්‍ය කලා සම්ප්‍රදාය ගුරු කොට ගත් අනුරාධපුර හා පොළොන්නරු යුගයන් හි චිත්‍ර ශෛලිය මහනුවර රාජධානි සමයේ දී වෙනස් මගකට යොමු විය.

(i) අනුරාධපුර යුගයේ සම්භාව්‍ය චිත්‍ර කලාව දක්නට ලැබෙන ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි.)

සීගිරිය, හිඳගල, ගොනාගොල්ල, මහියංගන ධාතු ගර්භය, දඹුල්ල, වෙස්සගිරිය, මිහින්තල ධාතු ගර්භය, කරඹගල, දනගිරිගල, දිඹුලාගල

(ii) පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි දක්නට ලැබෙන චිත්‍ර අතර 'බුදුරජාණන් වහන්සේ සංකස්ස නුවරට වැඩම කිරීම' සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

- බුදුන් වහන්සේ තව්තිසා දෙව් ලොව මාතෘ දිව්‍යරාජයාට දහම් දෙසා දෙවියන් විසින් මවන ලද රන් හිනිමගෙන් සංකස්ස පුරයට වැඩමකරන අයුරු තිවංක පිළිමගෙයි ගර්භ ගෘහයේ ඇති මෙම සිතුවමින් නිරූපණය වේ.
- පොළොන්නරුවේ සම්භාව්‍ය කලා ලක්ෂණ සහිත මෙම සිතුවමේ හිනිමං ත්‍රිත්වයක් දැක්වේ.
- බුදුන් දෙපස දෙවිවරු ඡත්‍ර දරා සිටිති.
  බුදුරුව ත්‍රිභංග ඉරියව්වෙන් යුතුව දැක්වෙන අතර වමත පහලට හෙලා දකුණතින් විතර්ක මුද්‍රාව දැක්වේ.
- දේව රූප ජීව පරිමාණයෙන් හා බුදුරුව ජීව ප්‍රමාණයට වඩා විශාලව චිත්‍රණය කර ඇත.
- මනා සංරචනයකින් යුතු මෙම සිතුවමේ ප්‍රාණ පූර්ණ රේඛාකරණය සම්භාව්‍ය වර්ණ භාවිත කිරීම, උසස් භාව ප්‍රකාශනය සුවිශේෂී ලක්ෂණ වේ.

(iii) මහනුවර චිත්‍ර සම්ප්‍රදාය තුළ දෙගල්දොරුව විහාරයේ හා දඹුල්ල විහාරයේ දක්නට ලැබෙන 'මාර පරාජය' සිතුවම් දෙක පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි.)

- 18 සියවසට අයත් මහනුවර යුගයේ චිත්‍ර කලා ලක්ෂණ සහිත ලෙන් විහාර දෙකකි.
- දෙවරගම්පොල සිල්වත් තැන දෙගල්දොරුවේ ප්‍රධාන සිතුවම් නිර්මාණ ශිල්පියා වන අතර දඹුල්ල විහාරයේ සිතුවම් නීලගම පටබැන්දා ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.
- විහාර දෙකෙහිම මාර පරාජය සිතුවම් වියන්තලයේ සිතුවම් කර ඇත. දඹුල්ලේ මාර පරාජය සිතුවම දේවරාජ ලෙනෙහි දක්නට ඇත.
- මෙම විහාර දෙකෙහිම සිතුවම් මධ්‍යයෙහි බුදුන් වහන්සේ වජ්‍රාසනා- රූඪව භූමි ස්පර්ශ මුද්‍රාවෙන් වැඩ සිටිති. පංච ශාඛා සහිත බෝධි වෘක්ෂය පාමුල බුදුන් වහන්සේ වැඩ සිටින අතර වජ්‍රාසනය පාමුළ පුන්කලසක් අතින් ගත් මහී කාන්තාව සිතුවම් කර ඇත.
- දෙගල්දොරුව මාර පරාජය සිතුවමේ බුදුන් පිටුපස යොදා ඇති බෝධි වෘක්ෂයේ පූජනීයත්වය දැක්වීමට ඡත්‍රයක් හා මලින් සරසා ඇත.

- මෙම වාස්තු විද්‍යා නිර්මාණයේ,
  - ප්‍රධාන අංගය පියස්සක් සහිත අඩි 24 පමණ උස ස්ථූපයයි.
  - චෛත්‍ය සතර දිසාවේ කළුගලින් කරන ලද කුඩා පිළිම ගෙවල් 4 කි.
  - පිළිමගෙවල් පියැසි මත කුඩා ස්ථූප හතරකි.
  - පිළිමගෙයි දිශා අටට මුහුණලා සිටින ඇතෙකුගේ ඉදිරිපස කොටස උන්නතව නෙළා ඇත.
  - පිළිමගෙවල් සිතුවමින් අලංකාරකර තිබූ බවට සාධක පවතී.
  - කළුගල් පාදම, දැවමය පියස්ස, ගඩොලින් තැනූ ස්ථූපය හා ස්ථම්භ මාධ්‍ය කිහිපයක් භාවිතයෙන් නිර්මාණය කර ඇත.

(iii) **දැව කැටයම් ඇසුරෙන් අලංකාර වූ ඇම්බැක්කේ දේවාලය ගම්පොළ යුගයේ හමුවන විශිෂ්ටතම කලාගාරයකි. එහි දක්නට ලැබෙන කැටයම් පිළිබඳව වර්ගීකරණය, මාධ්‍ය භාවිතය, ශිල්පක්‍රම හා ශිල්පීය කුසලතා ඇතුළත් විග්‍රහයක් කරන්න.** (ලකුණු 08 යි.)

- ගම්පොළ රජකල වන iii බුවනෙකබාහු රජු විසින් 14 වන සියවසේදී ඉදි කරන ලදැයි සැලකේ.
- දෙල්මඩ මූලාචාරීන් ප්‍රධාන ගෝල පිරිස විසින් මෙම ගෘහ නිර්මාණය සිදු කර ඇත.
- වාහල්කඩ, දිග්ගෙය, මණ්ඩපය, හා වැඩ සිටින මාලිගාව යන වාස්තු විද්‍යා අංගවලින් යුක්තය.
- දිග්ගෙය හෙවත් හේවිසි මණ්ඩපයේ දැව කණු 32 කි. පනේල කැටයම් 128 කි. වාහල්කඩ මණ්ඩපයේ කණු 10 කි, කැටයම් 40 කි.
- මෙම කැටයම් ගම්මාලු, පිහිඹියා., නා, කලුවර යන දැව වර්ග භාවිතයෙන් අල්ප හා අර්ධ උන්නත ශිල්ප ක්‍රමයට නෙලා ඇත.
  මෙහි කැටයම් කාණ්ඩ කිහිපයක් යටතේ වර්ග කල හැකිය.
  - සත්ත්ව රූප
  - කල්පිත රූප
  - මල්කම් හා ලියකම්
  - සමකාලීන සමාජ තේමා/ ජන ජීවිතය
  - වාටි මෝස්තර
- කැටයම්වල සුවිශේෂී ලක්ෂණ
  - විශිෂ්ට නිමාව හා සියුම්බව
  - ප්‍රකාශන ස්වරූපයේ ශෛලීගත බව
  - පනේලයේ සෑම අවකාශයක් ම පිරියන සේ සංරචනය
  - පනේල කැටයම් වටා අලංකාර ජ්‍යාමිතික සැරසිලි යෙදීම
- දැවමය ස්ථම්භ විචිත්‍රවත් කිරීම සඳහා පේකඩ හා පනේල කැටයම් යොදා ඇති අතර ස්ථම්භ සඳහා ද හතරැස් හා අට පට්ටම් හැඩ භාවිත කරමින් අලංකාර කර ඇත.
- මෙහි දිග්ගෙයි පියස්සේ නිර්මාණය කර ඇති "මඩොල් කුරුපාව" (කැණිමඬල) සහ කැටයම් වාස්තු ශිල්පියාගේ පරිනත බව ප්‍රකට කරන නිර්මාණ වේ.

3. හින්දු ආගමික සංකල්ප මත පදනම්ව නිර්මාණකරණයේ යෙදීම පොළොන්නරු යුගයේ වූ විශේෂිත ලක්ෂණයක් විය.

(i) පොළොන්නරු යුගයේ නිම වූ ලෝකඩ මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි.)

නටරාජා
පාර්වතී/ ශිව කාම සුන්දරී
ශිව පාර්වතී / ශිව සෝමස්කන්ද
ගණේශ / ගණපති
කාරෙයිකාල් අම්මෙයියාර්
අප්පර් ස්වාමි
ආදිත්‍ය/ සූර්ය
වටුක බහිරව
චන්දි කේශ්වර
සුන්දර මූර්ති ස්වාමි

(ii) අංක 1 ශිව දේවාලයේ ගෘහ නිර්මාණ ලක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

- 13 සියවසට අයත් ශිව දේවාල අංක 1 පොලොන්නරු පූජා නගරයට පිවිසීමේදි වම්පසින් දැකිය හැකි හින්දු ආගමික ගොඩනැගිල්ලකි.
- පාණ්ඩ්‍ය ගෘහ නිර්මාණ ලක්ෂණ දැකිය හැකි මෙම ගොඩනැගිල්ල කපා සකස් කරගන්නා ලද කළුගල් පුවරු හා ගඩොල් භාවිත කර නිර්මාණය කර ඇත.
- බදාම භාවිතයෙන් තොරව ඉදිකළ පාදම හා බිත්ති සඳහා සුමටව කපා සකසා ගත් ගල් කුට්ටි යොදාගෙන ඇත.
- මෙහි ශිඛරය ගඩොල් භාවිතයෙන් නිමවා ඇත. එහෙත් දැනට ශිඛරය නටබුන් වී ඇති බැවින් වහලයේ මුල් ස්වරූපය හඳුනාගත නොහැකිය.
- මෙහි බාහිර බිත්ති අලංකාර බොරදම්, පැන්නුම් කුලුණු හා විමාන ලක්ෂණ මෙන්ම අලංකාර කැටයම් දැකගත හැකිය.
- නෙලුම්මල් ආකෘතියේ පේකඩ, සත්ත්ව රූප, සත්ත්ව රූපවලින් හා සිංහ මුඛවලින් අලංකාර කරන ලද ගල් පාදම සුවිශේෂී ගෘහ නිර්මාණ ලක්ෂණ වේ.
- මණ්ඩපය, අන්තරාලය, ගර්භගෘහය යන සම්මත හින්දු ගෘහ නිර්මාණ ලක්ෂණවලින් යුක්තය.

(iii) පොළොන්නරු යුගයේ ඉදි වූ 'ථූපාරාම පිළිමගෙය' හින්දු ආගමික ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව නිම වූ බෞද්ධ සිද්ධස්ථානයකි. එහි ආභාසය, සැලැස්ම, මාධ්‍ය භාවිතය හා බාහිර ලක්ෂණ ඇතුළත්වන පරිදි විමසීමක් කරන්න. (ලකුණු 08 යි.)

- මහා පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයක් ලෙස සැලකෙන පොළොන්නරු ථූපාරාම පිළිමගෙය 13 සියවසට අයත් ගෙඩිගේ සම්ප්‍රදාය නිරූපණය කරන ගඩොලින් නිමවන ලද්දකි.
- මෙය බොකු වහලය සහිත ගොඩනැගිල්ලකි. පිළිමගෙවල් අතුරින් වර්තමානයේ හොඳින් ආරක්ෂා වී ඇති මෙම පිළිමගෙය පොළොන්නරු පූජා භූමියේ දළදා මළුවේ දකුණුපස කෙලවර දැකගත හැකිය.
- මහා පරාක්‍රමබාහු රජුගේ මහින්ද නම් අමාත්‍යවරයා විසින් දළදා වහන්සේ තැම්පත් කිරීම සඳහා කරවන ලද ගොඩනැගිල්ලක් බව චූල වංශයේ සඳහන් වේ.

- **ආභාසය** - මෙය දකුණු ඉන්දීය ද්‍රවිඩ ගෘහ නිර්මාණ ලක්ෂණවලින් සමන්විත වේ.
- **සැලැස්ම** - මණ්ඩපය, අන්තරාලය, ගර්භ ගෘහය යන හින්දු ආගමික ගොඩනැගිලිවල පොදු සැලැස්ම අනුව ඉදිකර ඇත.
- **මාධ්‍ය භාවිතය** - මෙම ගොඩනැගිල්ලේ බිත්ති පුළුල්ව ගඩොලින් හා හුනු බදාමයෙන් (ස්ටෙකෝ) ගොඩනගා පියස්ස ආරුක්කු ආකාරයෙන් ගඩොලින් නිමවා ඇත.
- **බාහිර ලක්ෂණ** - ප්‍රතිමා ගෘහයට පිවිසෙන දොරටුව නැගෙනහිර දෙසට මුහුණලා නිමවා ඇත.

- අන්තරාලය වෙත ඇතුලුවීමට කුඩා දොරටුවක් උතුරු බිත්තියේ දක්නට ඇත.
- ගර්භ ගෘහයට වාතය හා ආලෝකය ලබා ගැනීම සඳහා දකුණු හා උතුරු බිත්ති දෙකෙහි ජනේල හතරකි.
- මෙහි පිටත බිත්ති විමාන තුළ දේවතා රූප සහ විමාන කුළුණු දාර, සිංහ, ගජ, හංස හා මල් ලියකම් රටා කැටයම් දැකිය හැකිය.
- පිළිමගෙයි අභ්‍යන්තරයේ වැඩ සිටින ඉරියව්වෙන් යුතු පිළිමය නෂ්ටාවශේෂව ඇත.
- මෙහි වහළය ගිංජිකාවසත ක්‍රමයට (ගිජු ලිහිණියෙකු වසා සිටින අයුරින්) තනා ඇත.

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** විවිධ යුගයන් හි පැවති ඉන්දීය සිතුවම් කලාව එකිනෙකට සුවිශේෂී වූ ලක්ෂණ සහිතව වර්ධනය වූවකි.

(i) අජන්තා සිතුවම් පාදක කොට ගෙන ක්‍රි.ව. 450 ට පෙර හා පසු ඉදි වූ ලෙන් වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02 යි.)

- හීනයාන
- මහායාන

(ii) ලෞකික තේමා ගුරු කොටගත් මෝගල් සිතුවම් සම්ප්‍රදායේ එන 'බාබුර් අධිරාජ්‍යයාගේ උද්‍යාන නිරීක්ෂණය' සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

- මෝගල් රජවරුන්ගේ රාජකීය ජීවිතයේ සිද්ධියක් නිරූපිත මෙම චිත්‍රය කොටස් දෙකක් යටතේ සංරචනය වී ඇත.
- චිත්‍රයේ ඉහළ කොටස ගල්කුළු සහිත භූ දර්ශනකට වෙන් කර ඇත. බාබුර් අධිරාජ්‍යාගේ මාළිගාව එම කොටසේ දක්වයි.
- චිත්‍රයේ පහල කොටසේ රාජකීය උද්‍යානයකි. එහි සිට බාබුර් අධිරාජ්‍යයා සේවකයින්ට උද්‍යාන අලංකරණයට උපදෙස් ලබා දෙන අයුරින් චිත්‍රණය කර ඇත.
- ගල්කුළුවලින් පහලට කුඩා දිය පහරකි. සිතුවම මාධ්‍යයෙහි සුදු පැහැති මලින් පිරුණු මල් ගසකි. උද්‍යානයේ තැනින් තැන වවිනා මල් ගස් හා වෘක්ෂලතාවන් ය.
- සිතුවම පෙර බිමෙහි පාත්තිවලට සාත්තුකරන සේවකයින් ය. මැද බිමෙහි අලංකාර මෝස්තර යෙදූ රතු පැහැති වස්ත්‍රයක් පැළඳ සිටින අධිරාජ්‍යයාය. සේවකයෙක් ඔහුගේ හිසට ඉහළින් අව් ආවරණයක් ඔසවාගෙන සිටී.
- පුද්ගල රූප ඇඳීමේ වඩාත් ස්වභාවිකවාදී ප්‍රකාශන ස්වරූපයන් පල කිරීම මෙන්ම, රජුගේ සහ සේවකයින්ගේ පෞද්ගලික ලක්ෂණ දක්වා ඇත.
- දියසායම් මාධ්‍ය උචිත අයුරින් වර්ණවල එළිය අඳුර වෙනස් කර ඇති අතර, චිත්‍රයේ සෑම කොටසක්ම විස්තරාත්මකව අවධානයෙන් හා සැලකිල්ලෙන් විචිත්‍රවත් වර්ණ භාවිතයෙන් පිරිසිදු ලෙස නිමවා ඇත.
- සමස්ත රූප රාමුවම පිරියන සේ සිතුවම සංරචනය කරඇති අතර, සිතුවම ගොඩනගා ඇත්තේ තරමක් ඉහළ සිට නිරීක්ෂණය කරන අයුරිනි.

(iii) ඉන්දීය කලා සම්ප්‍රදායයන් තුළ කාන්තා රුව නිර්මාණයේ දී ඊට සුවිශේෂී වූ විවිධතා දක්නට ලැබේ. අජන්තා සිතුවම් හි 'අප්සරා රුව' හා රාජ්පුට් සිතුවම් කලාවේ දක්නට ලැබෙන 'රාධා' සිතුවම පිළිබඳ සංසන්දනාත්මකව ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි.

- ක්‍රි.පූ 1 වන සියවසේ සිට ක්‍රි.ව 08 වන සියවස පමණ දිවෙන අජන්තා සිතුවම් අතර අප්සරා රූප විශාල අවකාශයක් පුරා ඇඳි ලෞකික තේමාවකි. 16 වන සියවසේ දි ආරම්භව 19 වන සියවස තෙක් දිවෙන රාජපුත් චිත්‍රකලාවේ එන රාධා සිතුවම ප්‍රමාණයෙන් කුඩා අවකාශයක් පුරා ඇඳි කාන්තා රුවකි.
- අජන්තා අප්සරා රුව සකසාගත් ස්වභාවික ගල් පෘෂ්ඨයක් මත ස්වභාවික අමුද්‍රව්‍යවලින් සාදාගත් වර්ණ භාවිතයෙන් ටෙම්පරා ක්‍රමයට ඇඳ ඇත. එහෙත් රාජ්පුත් රාධා සිතුවම කඩදාසි මත දියසායම් මාධ්‍යයෙන් ඔපෙක් ක්‍රමයට වර්ණ භාවිතයෙන් ඇඳ ඇත. (ක්‍ෂුද්‍ර කලා ශෛලිය)
- අජසරා රුව ස්වභාවික ශෛලීය ලක්ෂණ ගන්නා අතර රාධා චිත්‍රය ප්‍රාදේශීය කලා ලක්ෂණ මුසු වූ ශෛලිගත බවින් යුතුය.
- අප්සරා රුව නිර්මාණයේදී කටු සටහන් ගුරු පාටින් ඇඳ වර්ණ ආලේප කර, පසුව කලු පාටින් සියුම් බාහිර රේඛා දක්වා ඇත. වර්ණකරණයේදී රතු, නිල්, කහ, කොළ කලු, සුදු, වර්ණ හා ඒවායේ ප්‍රභේද භාවිත කර ඇත. රාධාගේ චරිත නිරූපණය කර ඇත්තේ ග්‍රාමීය රූමත් යුවතියන් ලෙසිනි. පැහැපත් පෙනුමකින් යුතු දීප්තිමත් හා විචිත්‍රවත් වර්ණ භාවිත කර ඇත. රන් පැහැය භාවිත කර සියුම් හා ප්‍රශස්ථ අයුරින් රේඛාකරණය සිදු කර ඇත.
- අප්සරා රුව නිරූපණයේදී බොහෝ විට උඩුකය පමණක් ඍජුදර්ශිව නිරූපණය කර ඇත. රාධාගේ රුව නිරූපණයේදී සම්පූර්ණ රූපයම පාර්ශවදර්ශී වශයෙන් සිතුවම් කර ඇත. මුහුණ පාර්ශවදර්ශිව දැක්වෙන අතර, ඇය විසිතුරු ඇඳුමකින් හා පර්දාවකින් යුතුව දැක්වෙන රූමත් යුවතියක් ලෙස දක්වයි.
- ත්‍රිමාණ ලක්ෂණ දැක්වීම, භාව ප්‍රකාශනය, කාන්තා ලාලිත්‍ය නිරූපණය, විස්තරාත්මකව බව, ආකර්ශණීය ඇඳුම් සහ අලංකාර ආභරණ පැළඳසිටීම, පිරිසිදු නිමාව මෙම සිතුවම් දෙකටම පොදුවූ ලක්ෂණයන්ය.

5. ක්‍රි.පූ. 25 සිට ක්‍රි.ව. 320 තෙක් අමරාවතිය කේන්ද්‍ර කොට ගෙන බිහි වූ කලාව 'අමරාවති කලාව' නම් වේ.

(i) අමරාවතියෙන් හමුවන වෘත්තාකාර පුවරු කැටයම් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි.

- නාලාගිරි දමනය
- අභිනිෂ්ක්‍රමණය
- රාහුල කුමරු දායාද ඉල්ලීම
- අංගුලිමාල දමනය
- පාත්‍රා ධාතුව රැගෙනයාම
- අග්නි ස්ථම්භයට වන්දනා කිරීම

(ii) ඉන්දීය අමරාවතී කැටයම් අතර එන 'මහාමායා සිහිනය' කැටයම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.

- මහාමායා දේවිය දැක්වෙන කැටයම් මාලාව අතර සිව්වරම් දේවියන්ගේ මෙහෙසියන් විසින් මහාමායා දේවිය අනෝතප්ත විලට ගෙන ගොස් නහවනු ලබන අයුරු නිරූපිතය.
- ආයත චතුරස්‍රාකාර ගල් පුවරුවක අල්ප උන්නත ශිල්ප ක්‍රමයට කැටයම් කර ඇත.
- සංරචනයේ දි මහාමායා දේවිය කැටයම මධ්‍යයෙහි දැක්වෙන අතර ඇය වටා මෙහෙසියෝ කළගෙඩි අතින් ගෙන සිටිති.
- සෑම මානව රුවක්ම ප්‍රධාන චරිතය හා බැඳි සිදුවීම හා මනාව සම්බන්ධ කරමින් නාරි ලාලිත්‍යයෙන් අනූනව වස්ත්‍ර ඇඟට ඇලුණ අයුරින් නෙලා ඇත.
- රූප දිගැටි, චාම්, රිද්මයානුකූල බවින් හා ක්‍රියාකාරීත්වයෙන් යුතුව නාට්‍යානුරූපීව දැක්වීමට ශිල්පියා සමත් ව ඇත.
- මෙම කැටයමේ තලය හා අවකාශ භාවිතයේ කුසලතාව මැනවින් කැපී පෙනෙන අතර මානව රූප නිරූපණයේදී ස්වභාවිකත්වයට බෙහෙවින් නැඹුරු ව ජීව ගුණයෙන් අනූන ය.

(iii) ඉන්දීය අමරාවතී සම්ප්‍රදායේ කැටයම් අතර හමුවන බුදු සිරිතේ සිද්ධීන් ඇතුළත් ස්ථම්භ කැටයමෙහි අන්තර්ගතය හා ශිල්පීය කුසලතා පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි.)

- අන්තර්ගතය -
  - බුදුන් වහන්සේගේ ජීවිතයේ අවස්ථා හතරක් (4) එකම පුවරුවක අභිනිෂ්ක්‍රමණය, බුදුවීම, ප්‍රථම ධර්ම දේශනය, පිරිනිවන් පෑම ලෙස පිළිවෙලින් පහල සිට ඉහලට අල්ප උන්නත ශිල්ප ක්‍රමයට නෙලා ඇත.
  - අභිනිශ්ක්‍රමණය දැක්වෙන කැටයමෙහි බෝසතුන් අසුපිට නැගී ගමන් කරන අයුරු දක්වා ඇත.
  - බුදුවීම දක්වන කැටයමෙහි මරඟනන් රඟන අයුරු විසිතුරුව කැටයම් කර ඇත.
  - දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව කැටයමෙහි බුදුන් වහන්සේගේ රුව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. පස්වග තවුසන් බුදුන් වහන්සේට නමස්කාර කරන අයුරින් දක්වා ඇත.
  - පරිනිර්වාණය කැටයමේ බුදුන් වහන්සේ දැක්වීම සඳහා ස්ථූප කැටයමක් දක්වා ඇත. එයට වන්දනා කරන්නන් ද කැටයම් කර ඇත.

- ශිල්පීය කුසලතා
  - මානව රුව නිරූපණයේදී ස්වභාවිකත්වයට බෙහෙවින් නැඹුරු වී ඇත.
  - සිද්ධිය හා සම්බන්ධ සෑම මානව රුවක්ම චලන ස්වරූපයෙන් හා ජීවී ගුණයෙන් යුතු ය.
  - මානව රූප දිගැටිය. ඇඳුම් චාම්ය. ආභරණ අඩුවෙන් හා ලාලිත්‍ය බවින් යුතුය.
  - සියුම් මටසිලිටි බවින් හා උසස් භාව ප්‍රකාශනයෙන් යුතු සංරචනයකි.

**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)**

**6.** උපස්ථිතිවාදයෙන් පසු බිහි වූ නව ප්‍රවණතාව වූයේ පශ්චාත් උපස්ථිතිවාදයයි.

(i) පශ්චාත් උපස්ථිතිවාදය බිහිවීමට තුඩුදුන් හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි.)

- උපස්ථිතිවාදී තේමා හා ශිල්පක්‍රමවල දක්නට ඇති ඒකාකාරී බවට එදිරිව ප්‍රතික්‍රියාවන් සිදු කිරීමට පෙළඹීම
- උපස්ථිතිවාදී සීමාවන් අතික්‍රමණය කිරීම
- පවතින සම්මතයන්ගෙන් ඔබ්බට යාමට උත්සාහ කිරීම
- ගැඹුරු භාව ප්‍රකාශනයන් සහිත වස්තු විෂයයන් ගවේෂණය කිරීමට යොමු වීම
- වර්ණ ආකෘතිය, රටාව, රේඛා යන අංශ පිළිබඳව නව අත්හදා බැලීම් සිදු කිරීම
- චිත්‍ර ඇඳීමේ පොදු අරමුණක් නොතිබීම හා ඒ ඒ ශිල්පියාට ආවේනික අපේක්ෂාවන් වෙනුවෙන් ශිල්පියාගේ ප්‍රකාශන කලාත්මක උපක්‍රම වෙනස් වීම

(ii) 'අප එන්නේ කොහි සිට ද?, අප කවුරු ද?, අප යන්නේ කොහාට ද?' (Where do we come from?, Who are we?, Where are we going?) යන පෝල් ගොගැන්ගේ (Paul Gauguin) සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

- පෝල් ගොගැන්ගේ සිතුවමක් වන මෙය තහිටි දූපතේ ජීවත් වූ කාලයේ නිර්මාණය කරන ලද්දකි.
- දාර්ශනික මෙන්ම, සංකේතාත්මක අර්ථ දනවන සිතුවමකි.
- කැන්වසය මත තෙල් සායමින් අඳින ලද ඉතා විශාල සිතුවමක් වන මෙය දකුණේ සිට වමට කියවිය යුතු සිතුවමකි.
- උපත හා මරණය හා ඒ දෙක ඔබ්බෙහි පැවැත්ම පිළිබඳ කතිකාවක් මෙම සිතුවමින් නිරූපිතය.
- සිතුවම තුළ කණ්ඩායම් වශයෙන් ගොනු කල රූප සමූහයක් දැකිය හැකි අතර තහිටි වාසීන්ගේ දේහ විලාසයෙන් උපත පිළිබඳව දකුණු කෙළවරේ බිළිඳෙකු සමග සිටින ස්ත්‍රී රූප තුනක් ද වම් කෙළවරේ මරණයට ආසන්න වූ ස්ත්‍රියක් ද චිත්‍රය මැද තරුණවිය හා මැදිවිය සම්බන්ධ සිදුවීම් මාලාවක් දැකිය හැකිය.
- පැතලි වර්ණ මෙන්ම රේඛාව කේන්ද්‍රීයව ගොඩ නගා ඇත.
- නීල වර්ණ දේව රූපය තුළින් පැවැත්මෙන් ඔබ්බෙහි තත්ත්වය පිළිබඳ ඇඟවුමක් මෙන්ම ප්‍රශ්න කිරීමක් ද වේ.

(iii) වින්සන්ට් වැන්ගෝ (Vincent Van Gogh) ශිල්පියාගේ 'අර්තාපල් බුදින්නෝ' (The Potato Eaters) සහ 'තරු පිරි රැය' (The Starry Night) එකිනෙකට වෙනස් වූ සිතුවම් දෙකකි. සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි

- පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පියෙකු වන වින්සන්ට් වැංගෝ ශිල්පියාගේ අර්තාපල් බුදින්නෝ සිතුවම හා තරුපිරි රැය සිතුවම එකිනෙකට වෙනස් අර්ථකථනයන් ගෙන හැර දක්වන සිතුවම් වේ.
- මානව ජීවිතය දයානුකම්පිත දෘෂ්ටියකින් බලා නිර්මාණය කල සිතුවමක් ලෙස අර්තාපල් බුදින්නෝ සිතුවම නම් කල හැකිය.
- තරුපිරි රැය සිතුවම ප්‍රකෘති පරිසරය නොව ශිල්පියාගේ භාවමය ආවේගයන්ට අනුරූපව රාත්‍රියක අසිරිය කැන්වසය මත තෙල් සායමින් ඇඳ ඇත.

**අර්තාපල් බුදින්නෝ**

- කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස දුෂ්කර ජීවිතයක් ගත කරන ගොවි පවුලක් රාත්‍රී ආහාර ගනිමින් සිටින අයුරු දැක්වේ.
- අඳුරු වර්ණ මාලාවක් භාවිතයෙන් අඳින ලද සිතුවම තුළින් ගොවීන්ගේ දුක්ඛිත බව මනාව පිළිබිඹු කෙරේ.
- අන්ධකාරයෙන් පිරුණු පසුබිමක අර්තාපල් අනුභව කරන මොවුන් ඉහලින් එල්ලා ඇති පහනින් නික්මෙන කනා මැදිරි එළියෙන් අඳුරු අවතාර රැසක් මෙන් දිස්වේ.
- අන්ධකාර පරිසරය මොවුන්ගේ දුක්ඛිතභාවය පිළිබඳ සංකේතයක් වන අතර විරූපී වූ මුහුණු දිගුකලක් ජීවන අරගලයේ යෙදීමෙන් ශේෂ වූ සංඥා මාත්‍රා බඳු ය.

**තරුපිරි රැය**

- සඳ, තරු, වළාකුළු සහිත රාත්‍රී අහස කැන්වසය මත සුළියක් මෙන් කරකැවෙන ලෙස යෙදූ වේගවත් පින්සල් පහරවලින් නාටකීය රිද්මයකින් චලනය වන රාත්‍රී අහසක් හා පරිසරයක් නිරූපණය වේ.
- සිතුවමේ මැද බිම හා පසුබිම පුරා රාත්‍රී අහස නිරූපිත අතර පෙරබිම නිදිගත් නගරය නිරූපණය කරයි.
- පෙරබිමේ සයිප්‍රස් ගස හා පසුබිමේ අහස ප්‍රවේගකාරී ලෙස චලනය වන බව පෙනේ. නිම්නයේ ඇති ග්‍රාමීය ප්‍රදේශය මේ දෙකට මැදි වී ඇත.
- නිල් හා කහ යන වර්ණ එකිනෙකට ප්‍රතිවිරුද්ධව භාවිත කොට අහස නිරූපණය කර ඇත.

***සැ.යු : සංසන්දනය පහත පියවරයන් ඔස්සේ සිදු කළ හැකිය. ලකුණු ලබා දීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.***

**තේමාව**

- අර්තාපල් බුදින්නෝ - කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස දැඩි දූෂ්කර ජීවිතයක් ගත කරන ගොවි පවුලක් රාත්‍රී ආහාරය අනුභව කරන අවස්ථාවකි.
- තරුපිරි රැය - රිද්මයානුකූලව චලනය වන රාත්‍රී අහසක් සහිත පරිසරයක් නිරූපිත අවස්ථාවකි

**මාධ්‍ය භාවිතය**

- මෙම සිතුවම් දෙකම කැන්වසය මත තෙල්සායම් මාධ්‍යයෙන් නිමවා ඇත.

**සංරචනය**

- අර්තාපල් බුදින්නෝ - සිතුවම ගෘහ අභ්‍යන්තරයක පෙරබිම හා මැදබිම තුළ තලය පිරී යන සේ රූප සියල්ල සංරචනය කර ඇත.
- තරුපිරි රැය - සිතුවම සංරචනයේදී පෙරබිමෙහි සයිප්‍රස් ගස හා නිදිගත් නගරයත් , මැදබිම හා පසුබිමෙහි විශාල ප්‍රදේශයක් පුරා පැතිරුණු අහසක් දක්වා ඇත.

**වර්ණ භාවිතය**

- අර්තාපල් බුදින්නෝ - සිතුවම සඳහා සම්භාව්‍ය ඒකවාර්ණික අඳුරුවර්ණ රටාවක් භාවිත කර ඇත.
- නිල් සහ කහ යන එකිනෙකට විරුද්ධ වර්ණ මූලික කරගෙන තරුපිරි රැය සිතුවම වර්ණ කර ඇත.

**ශිල්පීය කුසලතා**

අර්තාපල් බුදින්නෝ

- අඳුරු වර්ණ මාලාවක් භාවිතය තුළින් ගොවි ජීවිතයේ දුක්ඛිත බව නිරූපණය කරයි.
- අන්ධකාර පරිසරය, ඉහලින් එල්ලා ඇති පහනින් නික්මෙන කණා මැදිරි එළිය සහ මුහුණුවල ඇති විරූපී අවතාරමය ස්වභාවය තුළින් ඔවුන්ගේ කම්කරු ජීවිතයේ ඇති කර්කශ බව තීව්‍ර කරයි.
- මානව ජීවිතය දෙස සානුකම්පිත දෘෂ්ටියකින් බලා නිර්මාණය කර ඇත.

තරුපිරි රැය

- නාටකීය හා රිද්මයානුකූල කෙටි පින්සල් පහරවල් මගින් අහස නිරූපණය කිරීම
- ප්‍රකෘති පරිසරය නොව ශිල්පියාගේ භාවමය ආවේගයන්ට අනුරූපව පරිසරය නිරූපණය කර ඇත.

7. ඊජිප්තුවේ හමු වූ කලා අංග යුගයෙන් යුගයට වෙනස්වීම්වලට භාජනය වෙමින් වර්ධනය විය.

(i) පිරමීඩය ඊජිප්තුවේ විශේෂ වාස්තු විද්‍යා නිර්මාණයකි. එය වර්ධනය වූ අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

- මස්ටාබා
- පඩි පිරමීඩ
- වක ගැසුණු පිරමීඩ

(ii) නව රාජධානි යුගයට අයත් චිත්‍රකලා නිර්මාණයක් වූ 'නාටිකාංගනාවෝ සහ සංගීතඥයෝ' (Musicians and Dancers) සිතුවම පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

- ඊජිප්තුවේ තිබ්ස් වල නෙබාමූන් සොහොන් ගැබෙන් හමුවන නාටිකාංගනාවෝ සහ සංගීතඥයන් පිරිසක් අමුත්තන් ඉදිරියේ ප්‍රසංගයක යෙදෙන අවස්ථාව නිරූපිත සිතුවමකි.
- නව රාජධානි යුගයට අයත් මෙම සිතුවම ක්‍රි. පූ. 1350 පමණ කාලයට අයත්ය.
- පැරණි රාජධානි යුගයේ පැවැති ''කා'' ආත්ම සංකල්පය ඉවත් වී නව රාජධානි යුගයේදී නව සංකල්ප ඉස්මතු වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම සිතුවම සම්මත රීතිවලින් වෙනස් වූ අවස්ථාවක් පිළිබිඹු කරන සිතුවමක් ලෙස දැක්විය හැකිය.
- මෙම සිතුවමේ මානව රූප පාර්ශවදර්ශී, ඍජු දර්ශී වෙනුවට ඉතා නම්‍යශීලී ලෙස ද චිත්‍රනය කර ඇත.
- බටනලා වාදනය කරන රූව සම්පූර්ණයෙන් ඉදිරි පෙනුමින් යුතුව ද අනෙකුත් රූප මදක් හැරී සිටින අයුරින් ද දක්වා ඇත.
- ආභරණයෙන් පමණක් සැරසී නර්තනයේ යෙදෙන නග්න කාන්තා රූප දෙක ස්වභාවික්ත්වයට බරව ඇඳ ඇත.
- ස්වභාවිකව සකසා ගත් අඳුරු කහ, රතු,කලු,සුදු ආදී වර්ණ භාවිත කර වියළි බදාමයක් මත වර්ණ ගැන්වීමේ (ෆ්‍රෙස්කෝ සිකෝ) ශිල්ප ක්‍රමයට ඇඳ ඇත.
- රූප මතු කිරීමට බාහිර රේඛා යොදාගෙන ඇති අතර අවකාශය පිරවීමට රූපාක්ෂර( hieroglyphic) යොදා ඇත.

(iii) ඊජිප්තුවේ දක්නට ලැබෙන ප්‍රධාන දේවස්ථාන වන ලක්සෝර් (Luxor) හා අබුසිම්බල් (Abu Simbel) දේවස්ථාන පිළිබඳ පදනම් වූ සංස්කෘතික පසුබිම, මාධ්‍ය භාවිතය, ආකෘතිය හා බාහිර ලක්ෂණ ඇතුළත් සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි.)

| ලක්සෝර් දේවස්ථානය | අබුසිම්බල් දේවස්ථානය |
|---|---|
| සංස්කෘතික පසුබිම<br>• 18 වන රාජ වංශයට අයත් ආමෙන්හොටෙප් රජු ක්‍රි. පූ. 1350 දී මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. | • නව රාජධානි සමයේ රමේසස් රජුගේ නිර්මාණයකි. තමා වෙනුවෙන් හා අමුන්, හොරක්ති හා පතත් නම් දෙවිවරුන් වෙනුවෙන් මෙම දෙවොල ඉදි කර ඇත. |
| මාධ්‍ය භාවිතය<br>• වැලිගලින් තනා ඇත. | • කළුගල් භාවිත කර ඇත |
| ආකෘතිය<br>• විශාල ආගමික ගොඩනැගිලි සංකීර්ණයකි.<br>• නයිල් ගඟේ නැගෙනහිර නිම්නයේ පිහිටා ඇත.<br>• ප්‍රධාන වශයෙන් දේවස්ථාන 6 කින් යුතු ය.<br>• සමස්ත ගොඩනැගිලි සංකීර්ණය උස ප්‍රාකාරයකින් ආවරණය කර ඇත.<br>• මෙම දේවාල සංකීර්ණයේ 5000 වූ කුළුණු හා බාල්ක යෙදූ ශාලාව ඊජිප්තු වාස්තු විද්‍යාවේ ආකෘතිකමය ලක්ෂණ විදහා දක්වන අවස්ථාවකි. | • පර්වතය අභ්‍යන්තරයට හාරා නිර්මාණය කරන ලද දෙවොලක් වන අතර ජ්‍යාමිතික හැඩ බහුල ආකෘතියකින් යුතුය.<br>• එහි ද්වාර මණ්ඩපය ඉදිරිපස විශාල ප්‍රතිමා ඉදිකර ඇත. |
| බාහිර ලක්ෂණ<br>• මෙම දෙවොලේ ද්වාර මණ්ඩපයට දෙපසින් ආනත හැඩයට තැනූ දැවැන්ත බිත්ති දෙකකින් යුක්තය.<br>• වෘත්තාකාර විශාල ගල් කුට්ටි සම්බන්ධ කර වට ප්‍රමාණය අඩි 12 ක් සහ උස අඩි 52 ක් පමණ වූ කුළුණු බඳ කැටයම් සහිත වූ (උත්කීරණ ක්‍රමයට ) එක ලඟින් පිහිටි කණු මෙහි දැකිය හැකි අලංකාර නිර්මාණයකි<br>• එම කුළුණු ශීර්ෂ පැපිරස් පත්‍ර ස්වරූපයෙන් නිර්මාණය කර ඇත. | • මෙම දේවස්ථානයේ ඉදිරිපිට නිර්මාණය කර ඇති යුගල සහිත හිඳි ප්‍රතිමා දෙකකි.<br>• රමේසස් රජුගේ රුව පිළිබිඹු වන ආකාරයට අධි උන්නතව නෙලා ඇති මෙම ප්‍රතිමා අඩි 70 පමණ උසින් යුතුය.<br>• සූර්ය දිව්‍ය සංකල්පයට අනුව ගොඩනගන ලද දේවස්ථානයක් වන මෙහි මානව රූප නිර්මාණයේදී නීති රීති ක්‍රියාත්මක වූ ආකාරය ප්‍රතිමා නිර්මාණය තුළින් දැකිය හැකිය. එනම් දරදඬු, ඍජු අනම්‍ය ස්වභාවයක් එම ප්‍රතිමා තුළ දැකිය හැකිය.<br>• දේවස්ථානයේ අභ්‍යන්තරයට ඇතුළුවන කොටසේ දැකිය හැකි ප්‍රතිමා ''ඔසිරිස්'' දෙවියන් නිරූපණය කරයි. |

සැලකිය යුතුයි.

*චිත්‍ර කලාව 11 හා 111 පත්‍ර සඳහා පිළිතුරු සැපයීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත සපයා ඇති අනුහුරු අභ්‍යාස පොත පරිශීලනය කිරීමෙන් ගුණාත්මක ඇගයීමක ප්‍රවේශයක් හා උපදේශනයක් ලබාගත හැකිය. එහි දක්වා ඇති උදාහරන අනුව ලකුණු ප්‍රදානය කිරීමේ දී නිර්ණායක පදනම් කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.*

11. පත්‍රය - නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය


අභිමතාර්ථ

1 - ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රමශිල්ප භාවිතය මැන බැලීම.
2 - රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන්ගේ ගති ලක්‍ෂණ නිරූපණය වන සේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3 - වර්ණ භාවිත කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්‍ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.

11. වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙයින් ද්‍රව්‍ය සමූහය ඇසුරෙන් යථාරූපී චිත්‍රයක් ඇඳ වර්ණ කර නිම කිරීම අපේක්‍ෂා කෙරේ. මේ සඳහා ලකුණු ප්‍රදානය කිරීමේ දී අදාළ නිර්ණායකයන් යටතේ ම ලකුණු තීරණය කළ යුතු වේ. එකිනෙක නිර්ණායකයන් යටතේ අපේක්ෂකයා කොතෙක් දුරට ලඟා වී ඇත්දැයි නිවැරදි තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහි දී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීම කළ යුතු වේ.

ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - | ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව | - ලකුණු 20 |
| 2 - | ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | - ලකුණු 20 |
| 3 - | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාලෝකය, ත්‍රිමාණ ලක්‍ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) | - ලකුණු 20 |
| 4 - | වර්ණ භාවිතය හා ගති ලක්‍ෂණ දැක්වීම | - ලකුණු 20 |
| 5 - | චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව | - ලකුණු 20 |
| | 11. වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමි මුළු ලකුණු | - ලකුණු 100 |



'අ' කොටස - චිත්‍ර සංරචනය

අභිමතාර්ථ - ස්වභාවධර්මයේ දක්නට ලැබෙන ස්වාභාවික මෙන්ම නිර්මිත පරිසරයන්ගේ හා වස්තූන්ගේ ස්වභාවයත් ඒ තුළ සිදුවන සිද්ධීන් හා ක්‍රියාදාමයන් පිළිබඳවත් ලබා ඇති අත්දැකීම් චිත්‍රමය භාෂාවෙන් ප්‍රකාශ කිරීමේ නිර්මාණශීලී කුසලතාව හා රසඥතා වර්ධනය ඇගයීම.

අපේක්ෂකයන් තෝරාගෙන ඇති මාතෘකා ප්‍රකාශනය කිරීමේ දී විවිධ මට්ටමේ කුසලතා ප්‍රදර්ශනය කර ඇති අයුරු දක්නට ලැබේ. රේඛාව හැසිරවීමේ හා හැඩතල ප්‍රකාශනයේදී අවම කුසලතා මෙන් ම උපරිම කුසලතා ප්‍රදර්ශනය ක අවස්ථා දැකිය හැකි ය. වර්ණ භාවිතය තුළින් හා විවිධ වූ ශිල්ප ක්‍රම භාවිතයෙන් උපරිම කුසලතා දක්වන අය මෙන් ම ප්‍රායෝගික කුසලතා පෝෂණය කර නොගත් අපේක්ෂකයෝ ද වෙති. මේ නිසා එකිනෙක අපේක්ෂකයන් පෙන්වා ඇති ප්‍රායෝගික කුසලතාවන්ගේ මට්ටම හඳුනාගෙන ඒ අනුව නිර්ණායක පදනම් කරගෙන ලකුණු ප්‍රදානය කළ යුතු වේ. මෙහිදී ද පුද්ගල බද්ධ රුචිකත්වය ගැන නොසලකා ලකුණු ප්‍රදානය කළ මැනවි.

<u>ලකුණු දීමේ නිර්ණායක</u>

| | | |
|---|---|---|
| 1 - | තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේදී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව | - ලකුණු 20 |
| 2 - | රේඛා හැඩතල ඇසුරෙන් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව | - ලකුණු 20 |
| 3 - | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය ( පරිමාණ, පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය) | - ලකුණු 20 |
| 4 - | වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව | - ලකුණු 20 |
| 5 - | අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව | - ලකුණු 20 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 100 |

'ආ' කොටස - මෝස්තර නිර්මාණය

අභිමතාර්ථ - දෛනික ජීවිතයේ ඇතිවන විවිධ අවශ්‍යතාවන්ට හා සන්නිවේදන ක්‍රියාවලියට සරිලන පරිදි නිර්මාණශීලී සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

III. වැනි පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑහෙන අපේක්ෂක සංඛ්‍යාවක් ''ආ'' කොටස තෝරාගන්නා බව පෙනේ. මොවුන් අතුරින් වැඩි දෙනෙක් සිද්ධාන්තමය අවබෝධයකින් යුතුව නවතාවකින් යුතු මෝස්තර නිර්මාණයේ යෙදෙන අතර අනවබෝධයෙන් මෝස්තර නිර්මාණය කිරීමට වෙහෙසෙන අයද බෙහෝ ය. කෙසේ වෙතත් අපේක්ෂකයන්ගේ නිර්මාණ තුළින් පිළිබිඹු වන්නේ ඔවුන් අත්පත් කරගෙන ඇති හැකියා හා කුසලතා වන්ගේ පරිමාණයයි. නිර්ණායකයන් ඔස්සේ ඔවුන් දක්වා ඇති කුසලතාවන්ගේ ප්‍රමාණයන් තේරුම් ගෙන ලකුණු ප්‍රදානය කිරීම කළ යුතු වේ.

<u>ලකුණු දීමේ නිර්ණායක</u>

| | | |
|---|---|---|
| 1 - මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - | ලකුණු 20 |
| 2 - පාර්භාරික අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - | ලකුණු 20 |
| 3 - රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - | ලකුණු 20 |
| 4 - උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - | ලකුණු 20 |
| 5 - විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - | ලකුණු 20 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - | ලකුණු 100 |

## ඉ කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

අභිමතාර්ථ - වාණිජ අවශ්‍යතාවන්ට හා සන්නිවේදන ක්‍රියාවලියට සරිලන පරිදි නිර්මාණශීලී සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

නූතන සන්නිවේදන ක්‍රියාවලියට ගැලපෙන නිර්මාන කරුවන් බිහිකරලීමේ වැඩි නැඹුරුවක් හා ඉඩ ප්‍රස්ථා ඇති සුවිශේෂී විෂය ක්ෂේත්‍රය වනුයේ ග්‍රැෆික් චිත්‍ර නිර්මාණයයි. එහෙත් එම විෂය පන්තිකාමරයේ ක්‍රියාත්මක වීමේ යම් ඌනතාවක් නිසාදෝ එම විෂය කොටස තෝරාගන්නා අපේක්ෂකයන්ගේ යම් අඩුවක් දක්නට ලැබේ. ඉදිරිපත් වන අපේක්ෂකයන් පවා සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳව අනවබෝධයෙන් ඉදිරිපත් වන බව පැහැදිලිය. කෙසේ වෙතත් ප්‍රකාශ කර ඇති හැකියාවන්ගේ ප්‍රමාණයන් හොඳින් තේරුම් ගෙන, පහත සඳහන් නිර්ණායකයන් පදනම් කරගෙන ලකුණු තීරනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

<u>ලකුණු දීමේ නිර්ණායක</u>

| | | |
|---|---|---|
| 1 - මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - | ලකුණු 20 |
| 2 - වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - | ලකුණු 20 |
| 3 - රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - | ලකුණු 20 |
| 4 - උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - | ලකුණු 20 |
| 5 - විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - | ලකුණු 20 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - | ලකුණු 100 |

**III පත්‍රය,**

❖ මෙම පත්‍රය කොටස් තුනකින් සමන්විත වන අතර එම කොටස් තුනෙන්ම තෝරාගත් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක චිත්‍රයක් පමණක් ඇඳීම අපේක්ෂා කෙරේ.

අ. චිත්‍ර සංරචනය
ආ. මෝස්තර නිර්මාණය
ඉ. ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

යන කොටස් සඳහා ලැබෙන පිළිතුරු පත් ඇගයීමේදී ඒ එකිනෙකට අයත් නිර්ණායකයන්ට අනුව තක්සේරු කර ලකුණු ප්‍රදානය කළ යුතු වේ.

මේ සඳහා ද ඉහත කී අනුහුරු අභ්‍යාස පොත ඔබට මහගු අත්වැලක් සපයනු ඇත. එහි දක්වා ඇති උදාහරණ අවබෝධ කරගෙන ඒ අනුව නිර්ණායකයන්ට අනුව ලකුණු ප්‍රදානය කිරීම අත්‍යවශ්‍ය වේ.

**සටහන් ..........................**